**හැටන් දික්ඔය නගර සභාව - 2021**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

හැටන් දික්ඔය නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හැටන් දික්ඔය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

**-----------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ රු.144,123 ක ගැලපීම් අතිරික්තතා හා ඌණතා ගිණුමට (සමුච්චිත අරමුදලට) ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ගලපා තිබුණි. | මෙම ජ' නල් සටහන් මෙම වසරට අදාලව ගලපා අවසන් බැවින් මින් ඉදිරියට එවැනි සටහන් සමුච්චිත අරමුදලින් ගලපන බවට දන්වා ඇත. | ඉකුත් වර්ෂයේ වියදම් සමුච්චිත අරමුදලට ගැලපිය යුතුය. |
| (ආ) | නගර සභාව විසින් ඉදිරි වර්ෂය වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.3,542,935 ක ණය වාරික මුදල ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රයේ නොදක්වා දිගු කාලීන වගකීමක් ලෙසට දක්වා තිබුණි. | මෙය දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු සම්පූර්ණ ණය මුදලේ අන්තර්ගතය මාසිකව ණය වාරික දෙකක හා කාර්තුවකට තවත් ණය මුදලක වාරිකයද ගෙවීමේ දී අදාල මුළු මුදලින් ක්‍රම ක්‍රමයෙන් අඩු බව දන්වා ඇත. | ණය ප්‍රාග්ධන දිගු කාලීන හා කෙටි කාලීන ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල රු.258,777 ක ආදායම්ද, රු.896,559 ක වගකීම්ද, රු.162,392 ක වියදම්ද, ලෙස අවස්ථා 03 කදී එකතුව රු.1,317,728 ක් අඩුවෙන් දැක්වීම් පැවතුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණයහිමියෝ, නිවාස කුලී හා මුද්දර ගාස්තු යන ගිණුම් විෂයයන් 03 කට අදාල ශේෂ එකතුව මූල්‍ය ප්‍රකාශන අනුව රු. 10,060,348 හා ඊට අදාළ උපයෝගී ලේඛන අනුව ශේෂ එකතුව රු. 9,933,812 බැවින් රු.126,536 ක වෙනසක් පැවතුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | ගිණුම් ශේෂවල වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා අදාළ උපලේඛන හෝ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,292,731 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 38,190,887 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂය ආරම්භයේ පැවති හිඟයෙන් රු.8,553,698 ක්ද සමාලෝචිත වර්ෂයේ බිල්කළ වරිපනම් වලින් රු.4,654,938 ක්ද, ඒකක 2520 කින් පුද්ගලයින් 252 දෙනෙකුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණෙන් වරිපනම් බදු අය කිරීමේ ප්‍රගතිය ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි. | නොගෙවූ අයට රතු නිවේදන යොමු කර ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ආ) | වෙනත් ආදායම් | | |
| (i) | නගර සභවේ පවත්වාගෙන යන ත්‍රීරෝද රථ ආදායම් ලේඛනය අනුව 2014 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් දක්වා ත්‍රීරෝද රථ ගාස්තු හිඟය රු.4,498,231 ක් වූ අතර සමාලෝචිත වර්ෂයට අදාළව ත්‍රී රෝද රථ ගාස්තු ආදායම් ගණනය කර හෝ ගිණුම් ගත කර හෝ නොතිබුණි. | වැඩි කරන ලද ගාස්තු ගෙවීමට ත්‍රීරෝද රථ හිමියන් සිය අකැමැත්ත පළ කළ අතර ඔවුන් මෙකී ගාස්තු සාධාරණ ලෙස අඩුකර දෙන ලෙසට සභාව වෙතින් ඉල්ලීමක් කර ඇතත් මේ දක්වා ගාස්තු අඩු කිරීමට සභාව තීරණය කර නොමැති හෙයින් මෙම ගාස්තු අය වී නොමැති බවත්, දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ii) | 2018 හා 2019 වර්ෂවලට අදාළ රු.1,581,710 ක හිඟ තානායම් කුලිය 2022 පෙබරවාරි 02 විගණිත දිනය වනවිටද අයකර ගෙන නොතිබුණි. | කුලී ගෙවන ලෙස කිහිප වරක් දන්වා ඇතත් තානායම නැවත ආරම්භ කිරීමෙන් පසු හිඟ කුලී ගෙවීමට කටයුතු කරන බව පැවසුවද එය ඉටු නොකිරීම නිසා සභාවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ණය මුදලක් ගෙන තානායම නවීකරණය කිරීමට කටයුතු කරන බවත් හිඟ මුදල ගෙවා අවසන් කරන ලෙස 2022 මැයි 30 දින තානායම්කරුට නැවත දැනුම් දුන් බවත් දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේදී මධ්‍යම පළාතේ මාර්ග සංවර්ධන ප්‍රවාහන විදුලි බල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ රු 1,964,375.ක ප්‍රතිපාදන උපයෝජනය කර ඉදිකර තිබුණු ජීව වායු නිෂ්පාදන ව්‍යාපෘතිය නිසි අධ්‍යනයකින් තොරව ඉදිකර තිබුණු බැවින් ඉදිකළ දින සිට සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 25 විගණිත දිනය දක්වා වසර 06 ක කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | මෙම ජීව වායු ඒකකය පිහිටා ඇත්තේ නගරයේ ජනාකීර්ණ ස්ථානයක වන බස් නැවතුම්පළ අසලය මෙම පද්ධතිය ඉදි කර ඇති ස්ථානය ජීව වායු නිෂ්පාදනයට සුදුසු නොවන බැවින් මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බව දන්වා ඇත. | ජීව වායු ඒකකය උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ කසළ කළමනාකරණය සඳහා සේවකයින් 50 දෙදෙනකු සඳහා රු.123,154,983 ක වැටුප් වියදම් ගෙවා තිබූ අතර ලොරි රථ 01 ක් හා ට්‍රැක්ටර් රථ 03 ක් සේවයේ යොදවා ඉන්ධන හා අළුත්වැඩිය සඳහා රු.1,909,367 ක් ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දිරන කසළ මෙට්‍රික් ටොන් 2375 ක් හා නොදිරන කසළ මෙට්‍රික් ටොන් 04 ක් ඉවත් කර තිබූ අතර කසළ කළමනාකරණයට ස්ථානයක් සභා බල ප්‍රදේශය තුළ හඳුනා නොගැනීම නිසා මස්කෙළිය, තලවාකැලේ හා අකුරණ සභා වෙත රු.2,054,150 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් කර තිබුණි. | සභාව සතුව පවතින වර්ග කිලෝමීටර් දෙකක බිම් ප්‍රමාණය තුළ කසළ කළමනාකරණය කර ගැනීම සඳහා ඉඩකඩක් නොමැති වීම නිසා මෙසේ වියදම් දැරීමට සිදුවී ඇති බව දක්වා ඇත. | පිරිවැය අවම වන ලෙසට සන අපද්‍රව්‍ය කළමනාකරණය කළ යුතුය. |